**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් පවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ගොවි භාරකාර අරමුදලින් 2011 හා 2012 වර්ෂ වලදී ලබා ගෙන තිබූ පිළිවෙලින් රු. 500,000 ක් හා රු. 2,000,000 ක් වූ ණය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු රු.99,375 ක පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබා දී තිබුණු රු.179,703 ක් වූ ද්‍රව්‍යවල වටිනාකම, ප්‍රතිපූර්ණයේදී ණයගැති ගිණුම බැර කිරීම වෙනුවට ආදායම් ගිණුම බැර කිරීම නිසා එම ප්‍රමාණයෙන් ණයගැති ශේෂ හා ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණු "හඳුනා නොගත්" ශේෂය රු.57,000 ක් හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී ජලය සැපයීමේ යන්ත්‍ර ලබා ගැනීම සඳහා ගොවීන් 19 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.80,610 ක ණය මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) නිලධාරීන් 09 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු. 42,080 ක විවිධ ණය හා අත්තිකාරම් ශේෂයන් වසර 10 ක සිට හිඟ හිට ඇති නමුත් එම මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී ණය පදනම මත ලබා ගෙන තිබුණු සුව පෝෂ හා මව්පෝෂ පැකට්වල වටිනාකම වූ රු.64,500 සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල් කර නොතිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 18,771,491 | (i) භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| | | (ii) ස්ථාවර වත්කම් ලේඛනය |
| ඉතිරි තොගය | 629,866 | (i) තොග සමීක්ෂණ වාර්තා |
| | | (ii) උපලේඛනය |
| | | (iii) තොග පොත් |

### 1.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ | පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කර නොතිබුණි. |
| 3 (i) හා (v) වගන්ති | (I) රජයේ සංවර්ධන වැඩ පිළිවෙලට අනුකූලව සාමාජික හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය හා දේශීය නියෝජිතත්ව වල ආධාර ලබා ගැනීම. |
| | (II) ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර සහ වෙනත් ඒ හා සමාන විදේශ ආයතන සංගම් හෝ සමිති සමඟ සංයෝගවීම. |
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2012 අංක 2 දරන සංශෝධිත පනත | එක් මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 30 වන දින වන විට එකතු කල දායක මුදල් ප්‍රේෂණය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දායක මුදල් නියමිත දිනට නොගෙවීම මත අධිභාර ලෙස රු.179,625 ක් ගෙවීමට සිදු වී තිබුණි. |

(ඇ) අංක පීඊඩී /12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 4.2.2 වගන්තිය — සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛනය, තථ්‍ය කාර්යය සාධන දත්ත සමඟ කාලානුරූපීව සමාලෝචනය කර විචලනයන් පිළිබඳ පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 5.1.3 වගන්තිය — යාවත්කාලීන කල සංයුක්ත සැලැස්ම වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වූවත්, සමාලෝචිත වර්ෂයේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 — චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඉ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IAI/2002/02 — චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක හා මෘදුකාංග වෙනුවෙන් විස්තරාත්මක ලේඛණයක් පවත්වා නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 110 — හානි හා පාඩු ලේඛන පවත්වා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 177(1) — ලැබෙන මුලු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් බැංකු ගත යුතු වුවද දෙහිවල වෙළඳසැලේ වියදම පියවා ගැනීමෙන් පසු ඉතිරි ආදායම බැංකු ගත කිරීමේදී දින 02 සිට දින 18 ක කාල පමාවක් සිදුවී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371(2) ඇ ඡේදය — කාර්යය නිම කල විගස දෙන ලද අත්තිකාරම් පියවිය යුතු වූවත් 2011 වර්ෂයේ නිලධාරීන් 08 දෙනෙකු ලබාගෙන තිබුණු රු.240,000 ක අත්තිකාරම් හා සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 05

| | |
|---|---|
| | දෙනෙකු ලබා ගෙන තිබුණු රු.626,725 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 751 (1) හා 754 | මණ්ඩලයේ ක්‍රියාත්මක කිසිදු ව්‍යාපෘතියක් සඳහා බඩු ලේඛන හා තොග පොත් නිසි පරිදි පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.8,142,953 ක ඌණතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌණතාවය රු.6,471,589 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,671,364 ක පිරිහීම වර්ධනය සඳහා රු.20,949,210 ක රජයේ ප්‍රදාන අඩුවීම හා රු.7,043,561 ක මණ්ඩලයේ අදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ විවිධ අදියරයන් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|
| | 2012 | 2011 |
| | රු. | රු. |
| රජයේ දායකය | 37,703,796 | 70,335,762 |
| වෙනත් ආදායම් | 14,700,055 | 21,743,616 |
| වියදම | 45,846,749 | 76,807,351 |
| අතිරික්තය (ඌණතාවය) | (8,142,953) | (6,471,589) |
| ජංගම වත්කම් | 19,138,120 | 24,728,555 |
| ජංගම වගකීම් | 12,641,768 | 17,185,489 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩම්වල පවත්වාගෙන යනු ලැබූ පහත සඳහන් ගොවිපලවල් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.6,590,370 ක වියදමක් දරා තිබුණ ද ඒවායින් රු.5,391,047 ක පාඩුවක් ලබා තිබුණි. එම ගොවිපල තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත විවිධ ව්‍යාපෘතිවල ඉලක්කගත කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණු නමුත් ඒකකයක් සඳහා දරන ලද ඉලක්කගත වියදමේ වැඩිවීම 28% සිට 382% දක්වා පරාසයක් තුළ විය.

| ව්‍යාපෘතිය | ඉඩමේ ප්‍රමාණය | වර්තමාන තත්ත්වය | 2012 වර්ෂයට අදාල වියදම |
|---|---|---|---|
| | | | රු. |
| බුත්තල ගොවිපල | අක්කර 10 | 2012 සැප්තැම්බර් මාසයේ සිට වගාවන් කර නැත. | 1,629,037 |
| තණමල්විල ගොවිපල | අක්කර 16 | 2012 සැප්තැම්බර් මාසයේ සිට ප්‍රතිපාදන නොලැබී තිබුණි. | 1,268,272 |
| වඩ්ඩකච්චි ගොවිපල | අක්කර 125 | 2012 නොවැම්බර් මස සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා දී ඇත. | 3,693,061 |
| | | | 6,590,370 |

(ආ) මණ්ඩලයේ ස්වයං අරමුදලින් ක්‍රියාත්මක වන්නා වූ ව්‍යාපෘති 04 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයේදී රු. 4,893,288 ක අලාභයක් ලබා තිබුණි.

(ඇ) වෙළඳපල හා කර්මාන්තය පිළිබඳ කිසිඳු ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භකරන ලද විලමුල්ල පලතුරු බීම නිෂ්පාදන ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී රු.541,040 ක අලාභ ලැබීම හේතුවෙන් එහි නිෂ්පාදන කටයුතු නතර කර තිබුණි.

(ඈ) මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක රු.8,789,750 ක් වැය කර සහල් පිටි නූඩ්ලස් කර්මාන්තශාලාවක් ඉදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව මූලික වියදම් ලෙස රු.520,729 ක් වැයකර තිබූ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා එම ව්‍යාපෘතිය පසුව අත්හැර දැමීමට සිදුවී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවිහාර අරමුදලින් අවස්ථා 4 කදී ලබා ගන්නා ලද රු.5,020,833 ක් වූ ණය මුදල 2013 වර්ෂ තුළ ගෙවා අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ණය මුදලින් රු.479,167 ක් පමණක් ආපසු ගෙවා තිබුණි.

(ආ) වඩ්ඩකච්චිය ගොවිපල 2012 නොවැම්බර් මස සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා දී ඇති අතර, ආයතනය සතු රු.1,545,000 ක් වටිනා ගොයම් කපන යන්ත්‍රය 2013 ඔක්තෝබර් 30 දින වන විටත් ආපසු භාර ගැනීමට හෝ එහි වටිනාකම අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

- සංශෝධිත පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- අලුත්වැඩියාව අත්හැර දමා තිබෙන ඉදිකටු වැව හා වැලි වැව ප්‍රතිසංස්කරණය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත්ව ඇති හඳුනා නොගත් ශේෂයන් ඉවත් කිරීම.
- ව්‍යාපෘති සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ඈ) ගර්භණී මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබා දීමේ වැඩ සටහන යටතේ නිෂ්පාදිත පෝෂණ මලු සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් බෙදාහැරීමට සැලසුම් කර තිබුණු අතර දෙපාර්ශවය අතර ඇතිකර ගැනීමට යෝජිත අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමකින් තොරව 2012 දෙසැම්බර් 31 දිනට රු. 1,631,500 වටිනා පෝෂණ මලු 3,263 ක් සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් බෙදාහැර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක වැටක් හා ගේට්ටුවක් ඉදිකිරීමට රු.2,548,050 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම නිසා අතිරේක වැඩ ඇතුළුව සියලු වියදම් සඳහා රු.3,209,728 ක් හා වන්දි මුදලක් ගෙවන ලෙස නීතිඥ ආයතනයක් මගින් කොන්ත්‍රාත්කරු එන්තරවාසියක් එවා තිබුණි.

## 3.4 නිශ්ක්‍රිය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත සඳහන් යන්ත්‍ර අක්‍රියව කලංකුට්ටිය සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයේ ගබඩා පරිශ්‍රයේ තබා තිබුණි.

| විස්තරය | ප්‍රමාණය | අක්‍රියව පැවති කාලය (වර්ෂ) |
|---|---|---|
| සහල් පිටි නිෂ්පාදන යන්ත්‍ර | 02 | 01 |
| පිටි හලන මැෂින් | 01 | 01 |
| අශ්ව බල 15 මෝටර් | 01 | 01 |
| උඳු පිටි කිරීමේ යන්ත්‍රය | 01 | 05 |

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී සුවදැල් ස්ලෝ ෆඩ් ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන තිබුණු පහත සඳහන් භාණ්ඩ නිශ්කාර්යව පැවතුණි.

| විස්තරය | ප්‍රමාණය | මුදල |
|---|---|---|
| | | රු. |
| විදුලි පෝරණු | 02 | 152,872 |
| පේස්ට්‍රි යන්ත්‍රය | 01 | 340,000 |
| පේස්ට්‍රි මිශ්‍ර කිරීමේ යන්ත්‍රය | 01 | 187,500 |
| පාන් කපන යන්ත්‍රය | 01 | 112,500 |
| | | 792,872 |

## 3.5 ආර්ථික නොවන ගණුදෙනු

එක් ගමක් එක් බෝගයක් වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ 2009 වර්ෂයේ ආරම්භ කරන ලද කළු දෙහි ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ඒ සඳහා අවශ්‍ය වූ යන්ත්‍ර සූත්‍ර හා පෝරණු මිලදී ගැනීමට වැය කරන ලද රු.6,615,581 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

ස්ථිර හා කොන්ත්‍රාත් වශයෙන් අනුමත කාර්ය මණ්ඩලය 76 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 34 ක් වූයෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව අනුමත කාර්ය මණ්ඩලයෙන් 55% ක් විය.

## 3.7 වාහන උපයෝජනය

----------------------

පිරිවැය රු.1,191,190 ක් වූ වාහන 3 ක් අලුත්වැඩියා කිරීමේ වියදම අධික වීම නිසා ධාවන තත්ත්වයෙන් ඉවත් කර තිබුණු අතර ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) මූල්‍ය පාලනය

(ආ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඇ) ව්‍යාපෘති කලමනාකරණය

(ඈ) වත්කම් පාලනය